**නුවරඑළිය මහා නගර සභාව - 2023**

**----------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

නුවරඑළිය මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන
-------------------

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශේෂ පිරික්සුමේ හර හා බැර ශේෂයන් රු.2,363,043 කින් තුලනය නොවීම අවිනිශ්චිත ගිණුමකට බැර කර පසුව දෝෂයන් හඳුනාගෙන නිවැරදි කළ යුතු වුවත් එසේ කිරීමකින් තොරව අවිධිමත්ව සමුච්චිත අරමුදලින් කපාහැර තිබුණි. | ගිණුම නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව | ගිණුම් තුලනය නොවීමට හේතු පරීක්ෂා කර ශේෂ නිවැරදි කළ යුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ හිටි වෙළඳ බලපත්‍ර ගිණුමේ ශේෂය තුළ අන්තර්ගත රු.861,800 ක් නැවත ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ද්විගණනය වී තිබුණි. | 2024 වර්ෂය සඳහා අවසන් ගිණුම් සකස් කිරීමේදි නිවැරදි කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආරම්භක ශේෂ නිවැරදි කිරීමක් ලෙස දක්වා විවිධ තැන්පත් ගිණුමට රු.259,779 ක් බැර කර තිබුණ ද වෙනත් ගිණුමකට හර කර නොතිබුණි. මේ හේතුවෙන් ගිණුම් තුලනය වු ආකාරය පැහැදිලි නොවුණි. | 2024 වර්ෂය සඳහා අවසන් ගිණුම් සකස් කිරීමේදි නිවැරදි කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ඈ) | රාජ්‍ය හා පෞද්ගලික බැංකු ශාඛා දෙකක පවත්වාගෙන යන බැංකු ජංගම ගිණුම් දෙකක සෘජු බැර කිරීම්, හඳුනා නොගත් ලැබීම් , බැංකුව විසින් අයකර තිබුණු බැංකු ගාස්තු හා බැංකුවේ නිවැරදි කිරීම් වලට අදාළ එකතුව රු. 12,845,106 ක් හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | බැංකු සැසඳුම් පිළියෙල කිරීමට පෙර එවැනි ශේෂ හඳුනාගෙන මුදල් පොත සංශෝධනය කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය ප්‍රකාශනවල රු. 2,500,000 ක වාහනයක වටිනාකම ද්වීගණනය වී තිබුණෙන් මෝටර් රථ හා කරත්ත එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී අදාල නිවැරදි කිරීමට කටයුතු සිදු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයට අදාළ 2024 වර්ෂයේ අවස්ථා 10 කදී ගෙවන ලද රු. 1,239,060 ක් හා ඇණවුම් කරන ලද ගබඩා ද්‍රව්‍ය එකතුව රු. 1,706,208 ක් ණය හිමියන් යටතේ ගිණුම් ගත කර නොතිබුණු අතර ඉකුත් වර්ෂ වලදී නිරවුල් කර තිබුණු රු.617,365ක ගබඩා ණයහිමි ශේෂයන් තව දුරටත් ගබඩා ණය හිමියන් යටතේ දක්වා තිබුණි. | අදාළ නිවැරදි කිරීම් සිදු කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව | වර්ෂය අවසානයේ සියළු වගකීම් ගිණුම්ගත කළ යුතු අතර ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ ශ්‍රී ලංකා සංචාරක අධිකාරියේ ලියාපදිංචි හෝටලයකින් අයකළ යුතු රු.5,404,257 ක් වර්ෂයේ ආදායම් ලෙස හඳුනා ගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී අදාල නිවැරදි කිරීමට කටයුතු සිදු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඖ) | පොදු සැපයුම් ණයහිමියන් තුළ සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති රු. 617,365 ක වියදම් මේ වන විට ගෙවා අවසන් වී තිබුණ ද තවදුරටත් ගෙවිය යුතු ලෙස දක්වා තිබුණි. | 2024 වර්ෂයේ අවසන් ගිණුම තුළ නිවැරදි කිරීමට කටයුතු කරන බව | ණයහිමි ශේෂ නිවැරදි කළ යුතුය. |

1.6.2. නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ 02 කට අදාළ ශේෂයන් ඊට අදාල මූලික පොත් හා උපයෝගී ලේඛනවල ශේෂයන් සමඟ සැසැඳීමේදී රු. 8,626,982 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව | නොසැසඳීම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අවසාන තොග ගබඩා ශේෂ ඉදිරියට ගෙන ඒමේදී තොග ඒකක 153 ක ශේෂ ඍණ ශේෂ ලෙස සටහන් වී තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශයේ දක්වා තිබුණු රු. 64,163,288 ක තොග ශේෂය නිවැරදිතාවය තහවුරු කළ නොහැකි විය. | නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව | ගබඩා ලේඛන සහ තොග පාලනය විධිමත් කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට තොග පරිගණක මෘදුකාංගය අනුව ලබාගත් තොග ශේෂය හා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ගබඩා ද්‍රව්‍ය 54 ක රු.2,433,086 ක වෙනසක් පැවතුණි. | නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව | - එම - |
| (ඈ) | විදුලි දුම්රියේ වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයේ රු. 36,514,040 ක් ලෙස දක්වා තිබුණද මූල්‍ය ප්‍රකාශයේ රු. 19,920,398 ක් ලෙස දැක්වීම හේතුවෙන් 16,593,642 ක නොසැසඳීමක් පැවතුණි. | නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

1.7 අනුකූල නොවීම්
---------------------

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්
-------------------------------------------------

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පනත් | | | |
| i. | මහා නගර සභා ආඥා පනත (252 අධිකාරය) 247 ඉ (1) වගන්තිය | සභා බල ප්‍රදේශයේ පුද්ගලික සමාගම් 04 ක් විසින් වෙන්දේසියේ විකුණන ලද ඉඩම් කොටස් 46 ක විකිණීම මත බදු රු. 5,376,761 ක් අඩුවෙන් අයකර තිබුණි. | අය කර ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ii. | 2022 ජනවාරි 27 දිනැති අංක 2268/18 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලකළ 1980 අංක 47 දරන පාරිසරික පනතේ සඳහන් උපලේඛනයේ (අ),(ආ),(ඇ) වගන්තිය | නගර සභා සීමාවේ හෝටල් හා ලැඟුම්හල් 64 ක් පරිසර බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවතින හෝටල් හා ලැගුම් හල් බලපත්‍ර ලබා ගන්නා ලෙස දැනුම් දීමට කටයුතු කරන බව | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| iii. | 1993 ජුනි 24 දිනැති අංක 772/22 දරණ ගැසට් පත්‍රයේ පල කරන ලද 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 (V) වගන්තිය හා 450 වන අධිකාරිය | පෝනි මංතීරුව වගුරුබිමක ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2023 පෙබරවාරි 23 දින ආරම්භ කර 2023 අප්‍රේල් 20 දින පරිසර අධිකාරියේ අනුමැතියට අයදුම්පත් යොමු කර පරිසර අධිකාරියේ විරෝධය මත නවතා දමා තිබුණි. | ව්‍යාපෘතියට අදාළව මධ්‍යම පරිසර අධිකාරියෙන් වෙනත් නිර්දේශ ලබා දෙන්නේ නම් ඒ අනුව කටයුතු කර මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට කටයුතු කරන බව | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

| | | | | |
|---|---|---|---|---|
| i. | 2015ජූලි 14දිනැති අංක 2015/03දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සංශෝධනය කරන ලද මු.රෙ (2) 371(ආ) සහ 05වගන්තිය | වසර 05 ත් 08 ත් අතර කාලයක සිට පැවති රු. 1,189,500 ක අත්තිකාරම් ශේෂ 08ක් පියවා නොතිබුණි. | අත්තිකාරම් පියවීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ලිඛිතව දන්වා ඇති බව . | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ii. | මු. රෙ 396 (ඈ) | රාජ්‍ය බැංකු ශාඛා දෙකක පවත්වාගෙන යන ජංගම බැංකු ගිණුම් වල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාලය ඉක්ම වූ එකතුව රු. 14,244,223 ක චෙක්පත් 87 ක් මාස 06 සිට අවුරුදු 02 දක්වා කාල පරාසයක සිට නිරවුල් කර නොතිබුණි. | පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.231,769,227 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 219,928,379 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

නාගරික කොමසාරිස් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල්කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 140,549,100 | 122,819,119 | 110,778,126 | 137,974,418 | 139,912,400 | 129,038,341 | 138,880,404 | 125,933,424 |
| (ii) | කඩ කුලී | 111,932,700 | 63,991,762 | 53,240,344 | 70,378,359 | 78,955,000 | 58,864,187 | 56,869,600 | 73,329,599 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 22,252,000 | 26,908,286 | 25,343,036 | 34,341,807 | 19,807,000 | 23,595,274 | 17,610,877 | 27,280,075 |
| (iv) | වෙනත් ආදායම් | 439,352,100 | 105,425,835 | 38,853,911 | 108,658,328 | 465,849,100 | 54,395,698 | 45,294,666 | 47,561,373 |
| | | 714,085,900 | 319,145,002 | 228,215,417 | 351,352,912 | 704,523,500 | 265,893,500 | 258,655,547 | 274,104,471 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| i. | සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ වරිපනම් ශේෂය රු.84,347,443 ක් වූ අතර මින් පෞද්ගලික දේපලවලින් අයවිය යුතු වරිපනම් හිඟය රු.68,361,868 ක් විය. එයින් රු.62,765,267 ක මුදලක් වසර 01 සිට වසර 10 ට වැඩි කාලයක් සිට අයවිය යුතුව පැවතුණි. | හිඟ අය කර ගැනීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව හිඟ ආදායම් අය කළ යුතුය. |
| ii. | සමාලෝචිත වසර තුළ දේපල තහනම් කිරීම සඳහා හිඟ වරිපනම් පරිශ්‍ර 1221 ක් හඳුනාගෙන තිබුණද, ඉන් පරිශ්‍ර 9 ක පමණක් දේපල තහනමට ගෙන වරිපනම් රු. 467,063 ක් හෙවත් හිඟයෙන් සියයට 0.56 ක් පමණක් අයකර තිබුණි. දේපල තහනම් කරන අවස්ථාව වන විට රු. 100,000 ට වැඩි හිඟ හිටි පරිශ්‍ර 42 ක් පැවතියද දේපල තහනම් කිරීම සඳහා තෝරාගෙන තිබූ පරිශ්‍රවල හිඟය රු 9985 සිට 88,757 දක්වා පරාසයක පැවතුණි. | - එම - | - එම - |
| (ආ) | **කුලී** | | |
| i. | 2015 වර්ෂයේ සංවර්ධන කාර්යක දී නිවාස අහිමි වුවන් වෙනුවෙන් වෙනත් ස්ථානයක මසකට රු | ඒ සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව | හිඟ ආදායම් අය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 1000 බැගින් වසර 40 ක ගාස්තුව රු. 480,000 ක් ලෙස වත්කම් තක්සේරු කර දේපල 04 ක් ඔවුන් වෙත පවරා දීමටත් එක් නිවාසයක් ඉදිකිරිම සඳහා රු. 400,000 ක මුදල අයකර පවරා දීමට යන කොන්දේසිය මත නිවාස පවරා දී තිබුණද, එම නිවාසවලින් සභාවට අයවිය යුතු රු.1,807,000 ක මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| ii. | 2015 ජනවාරි 27 දිනැති අංක 2015/1 දරණ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය (අ)වගන්තිය අනුව කටයුතු කර වසර 01 ට වැඩි හිඟ කුලී පවතින නගර සභා බල ප්‍රදේශයේ පිහිටි කඩ 267 කින් රු.42,398,365 කඩකුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව | - එම - |
| iii. | 2023 දෙසැම්බර් 31 දිනට නගර සභා බලප්‍රදේශයේ පිහිටි කඩ කාමර 41 කින් එකතුව රු.3,009,505 ක කඩ කුලි හිඟයක් පැවති අතර වසර 01 ත් වසර 05 ත් අතර කාල පරාසයක් තුළ කඩකුලී හිමියන් 26 දෙනෙකුගෙන් අයවිය යුතු රු.2,769,067 ක් අය කර නොතිබුණි. | හිඟ ගාස්තුව අය කිරීමට වැඩ පිලිවෙළක් යොදා ඇති බව. | - එම - |
| (ඇ) | බලපත්‍ර ගාස්තු<br>---------------- | | |
| i. | 1981 ජනවාරි 20 දිනැති අංක 541/17 දරණ ගැසට් පත්‍රයේ පල කරන ලද 1952 අංක 08 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ XVIII වැනි වාහන නතර කර තැබීමේ අතුරු ව්‍යවස්ථාවේ II වන බාණ්ඩය මෝටර් රථ නතර කර තැබීම පරිච්ඡේදයේ 08 වගන්තියට අනුව වලංගු අවසර පත්‍රයක් ලබා ගැනීමකින් තොරව ලියාපදිංචි නොවු සංගම් 12 ක ත්‍රී රෝද රථ 158 ක් නගරයේ ධාවනය වන අතර ප්‍රවාහන සේවයේ යෙදෙන වෑන් රථ 24 ක් හා ත්‍රී රෝද රථ 253 ක් වාර්ෂික බලපත්‍ර ලබා ගෙන නොතිබුණි. | හිඟ ගාස්තු අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව | අතුරු ව්‍යවස්ථාව අනුව කටයුතු කර හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii. | 2023 දෙසැම්බර් 31 දිනට වාර්ෂික බලපත්‍ර ගිණුමේ ශේෂය රු.28,841,974 ක් වූ අතර එම මුදල වසර 01 සිට වසර 10 වැඩි කාලයක සිට පුද්ගලයින් 472 දෙනෙකුගෙන් අයවිය යුතුව පැවතියද, අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකරමින් පවතින බව | හිඟ ආදායම් අය කළ යුතුය. |
| (ඈ) | උසාවි දඩ හා මුද්දර ගාස්තු<br>----------------------------- | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 222,175 ක් හා මුද්දර ගාස්තු රු. 108,436,153 ක් විය. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බව | ආදායම් ගෙන්වා ගත යුතුය. |
| (ඉ) | වෙනත් ආදායම්<br>-------------------- | | |
| i. | කඩ කාමර 06 ක ටෙන්ඩර් ගාස්තු වලින් නගර සභාවට ලැබිය යුතු මුදල රු.11,199,465 ක වූ අතර ඒ තුළ වසර 05 කට වැඩි ශේෂ 2,804,914 ක්ද, වසර 01 ත් 05 ත් අතර හිඟහිටි ශේෂය රු.5,079,571 ක්ද පැවතියද හිඟ ශේෂය අය කර ගැනීම සඳහා මහා නගර සභා ආඥා පනතේ 254 (අ) (1) වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බව | හිඟ ආදායම් අය කළ යුතුය. |
| ii. | 2023 දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තු ශේෂය රු.34,662,599 ක් වූ අතර එයින් රු.13,655,196 ක් වසර 01 සිට වසර 10 ට වැඩි කාලයක් සිට ඒකක 1479 කින් අයවිය යුතු ජල ගාස්තු අයකරගෙන නොතිබුණි. එයින් රු.7,401,529 ක් හෙවත් සියයට 21 ක් රාජ්‍ය ආයතන 130 කින් අයවිය යුතුව පැවතුණි | ඉදිරියේදී හිඟ අය කරගැනීම කටයුතු කරන බව | හිඟ ආදායම් අය කළ යුතුය. |
| iii. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් බදු 168 දෙනෙකුගෙන් රු.18,964,375 ක ශේෂයක් අයවිය යුතුව පැවති අතර එම ශේෂය තුළ වසර 01 සිට වසර 20 ට වැඩි කාලයක සිට හිඟව පවතින ශේෂය රු.17,597,708 ක් විය. | කළමනාකරණ කමිටු වෙත යොමු කර සුදුසු තීරණයන් ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අය කළ යුතුය. |
| iv. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බෝට්ටු හිමියන් 22 දෙනෙකුගෙන් රු.10,170,012 ක හිඟ | මුදල් අය කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට | හිඟ ආදායම් අය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ශේෂයන් පැවති අතර ඒ තුළ රු.500,000 ට වැඩි බෝට්ටු හිමියන් 06 දෙනෙකුගෙන් රු.8,123,061 ක ශේෂයක් අයවිය යුතුව පැවතුණි. | ආදායම් පරීක්ෂකවරු වෙත ලිඛිතව පවරා ඇති බව. | |
| v. | හාවාඑළිය කසල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ 2016 වර්ෂය වෙනුවෙන් රු. 598,125 ක් හා උඩුපුස්සැල්ලාව මාර්ගයේ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ 2015 වර්ෂය වෙනුවෙන් රු. 122,286 ක් හිඟව පැවතියද, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි කටයුතු සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | හිඟ ආදායම් අය කළ යුතුය. |

03. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම
---------------------------------------------

මහා නගර සභා පනතේ 04 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අතුරු ව්‍යවස්ථා | | |
| i. | වාණිජ පරමාර්ථයෙන් පවත්වාගෙන යනු ලබන ග්‍රෙගරි වැව බෝට්ටු සේවාව විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යාවස්ථාවක් පිළියෙල කර 2020 නොවැම්බර් 27 දින අනුමැතිය සඳහා මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන දින දක්වා ඒ සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බව | අදාල වන අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතුය. |
| ii. | මහා නගර සභා ආඥා පනතේ 247 (අ) (ඇ) අනුව ආදායම් උත්පාදන කටයුතු සිදුකරන කර්මාන්තයක් ලෙස ක්‍රියාත්මක පෝනීන් ධාවනය නියාමනය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බව | අදාල අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතුය. |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | මහජන සේවා ඉටු කිරීම.<br>----------------------------<br>මහා නගර සභා ආඥා පනතේ 96 වගන්තියේ විධිවිධාන අනුව මහ නගර සභාව විසින් ජල මූලාශ්‍ර 9 කින් මහජනතාව වෙත බෙදාහරිනු ලබන ජලයෙන් ලබාගන්නා ලද සාම්පල් පරීක්ෂාවේදී එම ජලයෙහි පානීය ජලය පිළිබඳ සම්මත (SLS 614) ප්‍රමිතීන්ට වඩා අඩු මට්ටමක ගුණත්වයන් පවතින බවත්, නිසි පරිදි ක්ලෝරීන්කරණය සිදුකර නොමැති බවටත් හා කෝලීෆෝම් (Coliform) වැනි බැක්ටීරියා පවතින බවට වාර්තා මගින් තහවුරු වී තිබුණ ද ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බව | මහජනයාට පිරිසිදු පානීය ජලය ලබාදීමට ක්‍රියා කළ යුතුය. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
----------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 අගෝස්තු 28, දින අංක 1199/09 දරණ ගැසට් පත්‍රයේ පල කළ 2001 අංක 2 දරණ පළාත් සභා ප්‍රඥප්තිය අනුව මුද්දර ගාස්තු ආදායම් වසර 02 ක් තුළ රැස් කරගත යුතු වුවද, 2019 වර්ෂය සඳහා සභාවට අයවිය යුතු හා රු.13,411,960 ක මුද්දර ගාස්තු බිල්කිරීම් අයකරගෙන නොතිබුණි. | වසර 02 ට වැඩි හිඟ මුදල් ලේඛන වලින් කපා හැරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බව | හිඟ ආදායම් රැස් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පසුගිය වසර 05 ක කාලය තුළ මහා නගර සභාව විසින් සංචාරක ප්‍රවර්ධන නවෝත්පාදන ව්‍යාපෘති 05 ක් සඳහා අයවැය මඟින් රු.31,000,000 ක් වෙන්කර තිබුණද, උපයෝජනය කර තිබුණේ රු.1,627,205 ක් හෙවත් සියයට 05 ක් පමණක් වුයෙන් සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘති 03 ක් අතරමඟ නවතා දමා 02 ක් මන්දගාමීව ක්‍රියාත්මක වෙමින් පැවතුණි. | ව්‍යාපෘති යළි ආරම්භ කිරීමට අවධානය යොමු කර ඇති බව. | ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාවට අයත් කඩ කාමරවල තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2009 වර්ෂයේ අවසන්වරට කඩකුලී තක්සේරු කර තිබුණද, එම කුලිය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අයකිරීමට කටයුතු කර නොකිරීම හේතුවෙන් පරීක්ෂාවට ලක් වු කඩ 148 කින් වසර 15 ක් තුළ සභා අරමුදලට රු.55,609,875 ක මුදලක් අහිමි වී තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව එක්ව පවතින ගැටළු සාකච්චා කර සම්පූර්ණ කරගැනීමට කටයුතු සිදුකරමින් පවතින බව | තක්සේරු කුලිය අයකළ යුතුය. |

3.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1989 ජනවාරි 20 දිනැති අංක 541/17 දරණ ගැසට් පත්‍රයේ පල කරන ලද 1956 අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ XXXI වැනි ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග හා රග දැක්වීම් සම්මත අතුරු ව්‍යවස්ථා 1 වගන්තිය අනුව කටයුතු නොකර නුවරඑළිය ග්‍රෙගරි වැවට යාබදව පර්චස් 88.18 ක භූමි ප්‍රදේශයක් විනෝද සැණකෙළි භූමියක් ලෙස පවත්වාගෙන යාම සඳහා 2021 මාර්තු 23 දින සිට වසර 10 ක කාලයකට බාහිර පාර්ශවයකට නාගරික සංවර්ධන අධිකාරිය විසින් බදු දී තිබුණි. ඒ අනුව බදුකරු වාර්ෂික බලපත්‍රයක් මහා නගර සභාවෙන් ලබා නොගෙන සැණකෙළිය ආරම්භ කර වසර 03 ක කාලයක් ගත වී තිබුණද, විනෝද බදු අයකිරීමට හෝ කිසිදු නීතිමය කටයුත්තක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරි කටයුතු සිදු කර වාර්තා කරන බව | විනෝද බදු අයකළ යුතුය. |
| (ආ) | 2017 වර්ෂයේ රු.12,087,162 ක් වැය කර සෝලා විදුලි පහන් 200 ක් (වොට් 24 පහන් කනු 150 ක් හා වොට් 36 පහන් කනු 50 ක් ) සහිතව ඉදිකර තිබුණු ව්‍යාපෘතියේ සූර්ය කෝෂ වීදී ලාම්පුවල බැටරි මහා නගර සභා සේවකයින් විසින් ගලවා ඉවත් කර එය විනාශවීමට ඉඩහැර තිබුණි. | විගණන නිරීක්ෂණ සමග එකඟ වන බව | අදාල ව්‍යාපාති විධිමත් අධීක්ෂණයකින් පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගෝල්ෆ් ක්‍රීඩාපිටිය හරහා ඇවිදින මංතීරුවක් ඉදිකිරීම සඳහා ගොල්ෆ් ක්‍රීඩා සමාජය විසින් ඉදිරිපත් කළ ඉල්ලීමට අනුව 2021 නොවැම්බර් 16 දින පැවති සැලසුම් කමිටුව විසින් ඇවිදින මංතීරුව "නගර සභාව මගින් ලබාදී ඇති සැලසුම පරිදි ක්‍රීඩා සමාජයේ අරමුදලින්" ඉටු කිරීමට අවසර ලබාදී තිබියදී මහනගර සභාව විසින් ඉදිකර රු.1,081,898 ක් සභා අරමුදලින් වැයකර අලාභයක් සිදුකර තිබුණි. | බදු ගෙවන හා නුවරඑළිය නගරයට පැමිණෙන සංචාරකයින්ට ආරක්ෂිතව ගමන් කිරීම සඳහා ඉදි කරන ලද්දක් බව | සම්මත ක්‍රමවේදය හා අභ්‍යන්තර පාලන ක්‍රම අනුගමනය කර ව්‍යාපෘති ඉටු නොකිරීම සම්බන්ධව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ වසන්ත සැළකෙළියට සමාගාමීව නගර අලංකරණය සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවකින් පසු අත් මිල ගණන් තුනක් ලබාගෙන 2023-පෙබරවාරි-03, මාර්තු 15 හා අප්‍රේල් 04 දින වල රු. 2,048,440 ක මල් පැල මිලදී ගෙන තිබුණි. එසේ වුවද මල්පැල මිළදීගත් ආයතනය හැර අනෙකුත් ආයතන දෙකෙන් ඉදිරිපත් කළ ලිපි ව්‍යාජ ලෙස සකස් කර ඇති බවට අනාවරණය වුයෙන් රු2,048,440 ක මිලදී ගැනීම් ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව කටයුතු කර අක්‍රමිකතාවයක් සිදුකර තිබුණි. | මල් ඇට මිළදී ගැනීමට තෝරාගත් සමාගම මල් ඇට ලබාදීමට නොහැකි බව පැවසීම නිසා මල්පැල මිලදී ගැනීමට සිදු වූ බව | ප්‍රසම්පාදන ක්‍රමවේදය විනිවිදභාවයකින් යුතුව නිවැරදිව සිදු කළ යුතුය. |
| (ඉ) | වික්ටෝරියා උද්‍යානයේ වර්ධනය අඩු මල්පැල සිටුවීම සඳහා මල් පැල මිළදී ගැනීමට නාගරික ගණකාධිකාරී විසින් රු.100,000 ක අත්තිකාරමක් 2023 අප්‍රේල් 04 දින ලබාගෙන තෝරාගත් ටෙන්ඩර් කරුගෙන් පැල මිලදී නොගෙන වෙනත් පෞද්ගලික සමාගමකින් රු. 94,500 ක පැළ මිළදීගෙන පසුව තෝරාගත් ලංසුකරුගෙන් රු.126,000 ක ව්‍යාජ බිල්පතක් ලබාගෙන අක්‍රමිකතාවයක් සිදුකර තිබුණි. | සමාගමකින් පැල මිළදී ගෙන ප්‍රවාහනය කුලී සමඟ ඇතුළත් කර ජයග්‍රාහි ලංසුකරුගේ බිල්පත් ලබාගත් බව | ප්‍රසම්පාදන ක්‍රමය නිවැරදිව අනුගමනය කළයුතුය. |
| (ඊ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 24 (ඇ) හා 24 (ඈ) වගන්ති අනුව 2007 මාර්තු 05 දිනැති අංක 1487/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ III උපලේඛනයේ 03 වන කොන්දේසියට අනුව මධ්‍යම පරිසර අධිකාරියේ | මධ්‍යම පරිසර අධිකාරිය වෙත යොමු කර අනුමැතිය ලබා ගෙන ඉටු කිරීමට අපේක්ෂිත බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනුමැතියකින් හා නිර්දේශ ලබා ගනිමින් තොරව ග්‍රෙගරි වැවේ IV අදියරේ දී මහා නගර සභාව විසින්ම කොන්ක්‍රීට් ස්ලැබ් යොදා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.3,733,373 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් මහ නගර සභාවට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර තිබුණි. | | |
| (උ) | වික්ටෝරියා උද්‍යානයේ ආපන ශාලාව පවත්වාගෙන යාම වාර්ෂිකව සියයට 10 ක වැඩිවීමක් මත 2011 මාර්තු 15 දින සිට වසර 10කට බදුදීමට 2011 පෙබරවාරි මස පැවති මහා සභාවකදී තීරණය කර බදු දී තිබුණි. මෙම බදුකරු 2017 වර්ෂයෙන් පසු කිසිදු බදු මුදලක් සභාව වෙත නොගෙවා 2021 මාර්තු මස දක්වා මාසික වාරික 45ක් හිඟ හිටවා තිබුණු අතර 2021 මාර්තු 14 දින අදාළ ගිවිසුම අවසන් වන දිනට බදුකරුගෙන් අයවිය යුතු මුදල රු. 2,220,774 ක් විය. මේ සම්බන්ධව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නීතිමය කටයුතු සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව | හිඟ අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

3.4 නිශ්කාර්ය හා ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ
---------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.6,587,500 ක වාහන 09 ක් භාවිතයට නොගෙන නිශ්කාර්යව හා ඌන උපයෝජිතව පැවතුණි. | ධාවන තත්තවයේ නොපවතින වාහන , අපහරණය කිරීම සඳහා අදාල තොරතුරු 2023.03.21 දිනැතිව පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇති බව. | අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නුවරඑළිය ප්‍රදේශයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ට අවශ්‍ය තොරතුරු සැපයීම සඳහා වික්ටෝරියා උද්‍යානය අසල පිහිටා ඇති මහා නගර සභාව විසින් මෙහෙයවන තොරතුරු මධ්‍යස්ථානය තුළින් සංචාරකයින්ට නිසි මඟ පෙන්වීමක් සිදුවී නොතිබුණි. එය භාරව කම්කරු නිළධාරියෙකු පත්කර තිබූ අතර සංචාරක ස්ථාන 12 ක් සම්බන්ධයෙන් පමණක් දැනුවත් කිරීම් සිදුකර තිබුණි. | සංචාරකයින්ට යටිතල පහසුකම් හා සංචාරක තොරතුරු දැන ගැනීමට අවශ්‍ය පහසුකම් සහිත ගොඩනැගිල්ලක් බවට පත් කිරීමට සැලසුම් කර ඇති බව. | නිසි පරිදි නඩත්තු කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | සැල්වීනියා සහ ජපන් ජබර විසින් ග්‍රෙගරි උද්‍යානයේ සියයට 30 කට අධික ප්‍රදේශයක් මේ වන විට ආක්‍රමණය කර ඇති අතර යුලැක්ස්,යෝධ නිදිකුම්බා, ගඳපාන, කටු පතොක් ආදී විශේෂයන්ද නුවරඑළිය නගර සීමාව තුළ ව්‍යාප්ත වෙමින් පවතින නමුත්, මෙම ආක්‍රමණික ශාක විනාශ කිරීමට කටයුතු කර නොතිබුණි. | ආක්‍රමණික ශාක ඉවත් කිරීමට තරම් කාර්යය මණ්ඩලයක් සභාව සතුව නොමැති බව | අක්‍රමණික ශාක ඉවත් කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ග්‍රෙගරි වැව අදියර I හි සංචාරකයින්ට විවේක ගැනීමට ස්ථානයක් නොමැති වු අතර අදියර III හා IV හි පිහිටි විවේකාගාරය අපිරිසිදු වීම, වැසිකිළි ආසන්නයේ පිහිටීම, ගවයින් ගැවසීම හේතුවෙන් සංචාරකයින් භාවිතා නොකර අත්හැර දමා තිබුණි. | විවේකාගාර හා වැසිකිළි පිරිසිදු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීමත්, අධීක්ෂණය කිරීමත් සිදු කරන බව . | නිසි ලෙස නඩත්තු කළ යුතුය. |
| (ඈ) | ග්‍රෙගරි වැවේ අනුමත බෝට්ටු සංඛ්‍යාව 115 ක් වුවත් සභාව විසින් එම බෝට්ටු පිළිබඳ කිසිදු නියාමනයක් සිදු කර නොතිබුණි. බෝට්ටුවලින් වැව් ජලයට තෙල් ආදිය කාන්දුවීම් සිදු වීමෙන් පරිසර හානි සිදු වී | වැඩපිළිවෙලක් සකස් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව | බෝට්ටු ධාවනය විධිමත් කිරීමට කටයුතු කළ යුතු බව |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. අධිවේගී බෝට්ටු ධාවනය හේතුවෙන් වැව් ඉවුර ඛාදනයට ලක් වී තිබුණි. | | |
| (ඉ) | ග්‍රෙගරි වැවෙහි හතරවන අදියරෙහි රු. 17,509,603 ක වියදමින් 2015 වසරේ ඉදිකර ඇති අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් (interlock) මාර්ගය සම්පූර්ණයෙන්ම වල් බිහිවී ඌණ උපයෝජිතව පැවති අතර තැනින් තැන සෝදා පාළුවී ගල් ගැලවී ගොස් තිබුණි. රු. 4,262,224 ක් වැය කර වැවේ 04 වන අදියරේ ඉදිකළ පොදු විථි පහන් කණු සියල්ල විනාශ කර දමා තිබූ අතර ඒවා පිළිසකර කිරීමට කටයුතු කර නොතිබුණෙන් ග්‍රෙගරි වැව රාත්‍රි කාලයේ සම්පූර්ණයෙන්ම අඳුරේ පැවතුණි. ග්‍රෙගරි වැවේ අදියර II හා IV ප්‍රදේශවල වැට මායිම් සකස් කර වැව් පිටිය ආරක්ෂා කිරීමට හා අනවසර පිවිසුම් වැළැක්වීමට සභාව පියවර ගෙන නොතිබුණි. | වැට මායිම් නොසලකා පෝනින් හා ගවයන් ඇතුළු වීම වැළැක්වීමට ප්‍රථම පෝනින් ගාල් කිරීමට සුදුසු ස්ථානයක් සකස් කළ යුතුය.ඉන්පසු වැට මායිම් සකස් කර අනවශ්‍ය ඇතුල්වීම් වැළැක්වීම වඩාත් සාර්ථක විය හැකි බව | ග්‍රෙගරි වැව නිසි ලෙස නඩත්තු කළ යුතුය. |
| (ඊ) | මධ්‍යම වෙළඳපොළේ මාළු වෙළඳසැල වික්ටෝරියා උද්‍යානයට මායිම්ව පවත්වාගෙන යන අතර එහි අප ජලය සෘජුව තලගල ඔයට මුදාහැරීම හේතුවෙන් ග්‍රෙගරි වැව අපවිත්‍ර ව තිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි අදාළ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු සිදුකර ඇති බව | අපජලය විධිමත්ව බැහැරලිය යුතුය. |
| (උ) | ග්‍රෙගරි වැව් බැම්මේ ඉදිකිරීම් කටයුතු අඩාල වී ඇති අතර ඒ හේතුවෙන් ඉවුර ඛාදනය වී ඇත. මේ හේතුව නිසා බෝට්ටු හිමියන්ට තම බෝට්ටු රඳවා තැබීම ගැටළුවක් වී ඇති අතර එම ඉවුර නැවත පිළිසකර කිරීමට නගර සභාව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | ග්‍රෙගරි වැවෙහි බෝට්ටු ධාවනය නියාමනය කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව | ග්‍රෙගරි වැව නිසි ලෙස නඩත්තු කළ යුතුය. |
| (ඌ) | 1980 සිට සභාවට ලැබී තිබුණු වාහන 04 ක අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොන්ක්‍රීට් ආස්තරනයක් සඳහා රෙඩිමික්ස් කොන්ක්‍රීට් ඝණ මීටර් 33 ක් මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර මිල ගණන් කැඳවීමකින් තොරව 2023 මාර්තු 15 දින එක් පෞද්ගලික ආයතනයකින් පමණක් මිල ගණන් ලබාගෙන තත්ත්ව පරීක්ෂාවක් හෝ සිදුනොකර රෙඩි මික්ස් කොන්ක්‍රීට් ඝණ මීටර් 32 ක් සඳහා රු. 1,729,600 ක් ගෙවා තිබුණි. | නුවරඑළිය ප්‍රදේශයේ පවතින ආයතනයේ මිළදී ගැනීම් සිදුකළ බව හා රසායනාගාර වාර්තා අදාළ සමාගමෙන් ලබාගත් බව | විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |

## 3. 7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ග්‍රෙගරි වැව ගොල්ෆ් ක්‍රීඩා පිටියේ විවේකාගාරයක් ඉදිකිරීම සඳහා රු. 2,820,836 ක මුදලකට ගිවිසුම්ගතව ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකුට පවරා ගොඩනැගිලි සම්මත පිරිවිතරයන්ට අනුකූල නොවන ලෙස ප්‍රමිතියෙන් තොරව සිදු කරන ලද ඉදිකිරීම් වෙනුවෙන් රු 1,884,734 ක් ගෙවා තිබුණි. ඉදිකිරීම් පරීක්ෂා කිරීමේ දී කොන්ක්‍රීට් යෙදීම සහ පුහුණු නුපුහුණු ශ්‍රමය වෙනුවෙන් රු. 567,950 ක් වැඩිපුර ගෙවා තිබුණි. එසේම මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතියකින් තොරව පරිසර ආරක්ෂක කලාපය තුළ ඉදිකිරීම් සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරිය නීතිමය ක්‍රියාමාර්ග වලටද එළඹ තිබුණි. | අඩුපාඩු සකස් කර ගැනීමට කටයුතු කරන බව | අදාල අනුමැතීන් ලබාගෙන ඇස්තමේන්තුවේ ප්‍රමිතියට වැඩ ඉටු කළයුතුයි. |

3.8 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට තනතුරු 33ක පුරප්පාඩු 132ක්ද ,අනුමත තනතුරු 03ක අතිරික්ත 55ක්ද , අනුමත නොවූ තනතුරු 03ක අතිරික්ත 14ක්ද ඇතුළුව අතිරික්ත තනතුරු 69ක් පැවති අතර ඉංජිනේරු තනතුරත් ,ආදායම් පරීක්ෂක තනතුරු 04ක් ,මහජන සෞඛ්‍ය පරීක්ෂක නිළධාරී තනතුරු 03ක් හා කළමනාකරණ සේවා තනතුරු 13ක් පුරප්පාඩුව පැවතුණි. | දැනට අනුයුක්ත වී සිටින නිලධාරින්ගේ සේවය උපරිම වශයෙන් ලබා ගැනීමට කටයුතු කරන බව. | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මියගිය, විශ්‍රාම ගිය වැඩ තහනමට ලක් වූ, සේවය හැර ගිය හා ස්ථාන මාරු වී ගිය නිළධාරීන් 78 කගෙන් එකතුව රු.2,893,861 ක ණය ශේෂයක් අයකර නොතිබුණි. | තවදුරටත් අය කර ගත යුතුව ඇති ශේෂ පරීක්ෂා කරමින් පවතින බව | ණය ශේෂ අයකළ යුතුය. |

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මානව සම්පත් අවශ්‍ය ප්‍රමාණයට පැවතියද මහා නගර සභා බල ප්‍රදේශය තුළ කසළ කළමනාකරණය නිසි පරිදි සිදු වී නොමැති අතර කාඩ්බෝඩ්, ප්ලාස්ටික් බෝතල්, පොලිතීන් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය සියල්ල සඳතැන්න කසළ බිම් පිරවුමට බැහැර කර තිබුණි. | නිසි සැලසුමකට අනුව කසළ කළමනාකරණය ඉටු කිරීමට පියවර ගන්නා බව | කසළ කළමනාකරණය විධිමත්ව ඉටුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2004 – 2016 සංවර්ධන සැලැස්මෙන් ඉදිකිරීමට සැලසුම් කළ යෝජිත මලාපවාහන පද්ධතිය වසර 20 කට පසුවත් මහ නගර සභාව විසින් ස්ථාපිත නොකිරීම හේතුවෙන් බැරැක්ප්ලෙන් වැව, ග්‍රෙගරි වැව හා ගැල්වේස්ලෑන්ඩ් රක්ෂිතයට මල අපද්‍රව්‍ය බැහැර කිරීමෙන් දූෂණයට ලක් වී තිබුණි. | නිසි සැලසුමකට අනුව කසළ කළමනාකරණය ඉටු කිරීමට පියවර ගන්නා බව | කසළ කළමනාකරණ ය විධිමත්ව ඉටුකළ යුතුය. |
| (ඇ) | මහ නගර සභා ආඥා පනතේ 98 (1) වගන්තිය අනුව නගරයේ පොදු කාණු පවිත්‍ර කිරීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි. | නිසි සැලසුමකට අනුව කසළ කළමනාකරණය ඉටු කිරීමට පියවර ගන්නා බව | කසළ කළමනාකරණ විධිමත්ව ඉටුකළ යුතුය. |